සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2018 | 11 ශ්‍රේණිය
இரண்டாம் தவணைப் பரீட்சை 2018 | தரம் 11
**Second Term Test 2018** | **Grade 11**

**පෙරදිග සංගීතය II**
**Oriental Music II**

පැය දෙකයි
*Two hours*

පළමුවන ප්‍රශ්ණය ඇතුළුව තවත් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01. i. මධ්‍යයම හා නිශාදය වර්ජිත වන රාගය නම් කරන්න.

ii. විකෘති ස්වර දෙකක් යෙදෙන සම්පූර්ණ ජාතියට අයත් රාගයක් නම් කරන්න.

iii. සාදු දන්ත දා සහ පාරමිතා බල පූජිත යන ගීත සඳහා පදනම් වී ඇති රාග දෙක පිළිවෙලින් ලියන්න.

iv. මාත්‍රා 2 සහ 3 වශයෙන් විභාග වෙන්වන හින්දුස්ථානී තාලපදය නම් කරන්න.

v. |සත්සි|යක්කපු|මල්රැ|ගෙනමම| යන ගීපදයට ගැළපෙන දේශීය තිත නම් කරන්න.

vi. මුද්‍රප්පදය නමින් විශේෂ කොටසක් දක්නට ලැබෙන ගායනා විශේෂය කුමක්ද ?

vii. දෙවියන් උදෙසා ගැයෙන භක්ති ගීත විශේෂය නම් කරන්න.

viii. ව්‍යවහාරික සංගීත ප්‍රස්තාර ක්‍රමයේදී [[ ]] ලෙස යෙදෙන සංකේතය කුමන නමකින් හැඳින්වේද ?

ix. අනාඝාතාත්මක මෙහෙ ගීයක මුල් පාදය ලියා දක්වන්න.

x. පහතරට ප්‍රධාන ගැමි නාට්‍ය විශේෂය කුමක්ද ?

(ල. 12)

02. i. පහත සඳහන් ස්වර සංඝති ඇතුලත් රාග නම් කරන්න.

1. සධ̣සරිග, ගපධස, ගරිස
2. රිගරිම, ගරිස, සරිගමප
3. නි̣රිගරි, නි̣රිස, නිරිගම'ප
4. ගප, මගමරිස, ගපධනිස̇ (ල. 04)

ii. ඉහත රාග අතුරින් ඔබ කැමති රාගයක මධ්‍යලය ගීතයේ ස්ථායී කොටස හෝ වාදිතයක ස්ථායී කොටස ප්‍රස්ථාර කර දක්වන්න. (ල. 04)

iii. ඉහත ගීතය සඳහා වැයීමට සුදුසු හින්දුස්ථානී තාලපදය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.

(ල. 04)

03. i. පහත දැක්වෙන ජන ගී ලැයිස්තුව උපයෝගී කරගනිමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| මෙහෙ ගී | ඇදහිලි ගී | සමාජ ගී | සේ ගී |
|---|---|---|---|
| i. | ii. | iii. | iv. |
| v. | vi. | vii. | viii. |

(කලගෙඩි සෙල්ලම, තුන්සරණේ කවි, වන්නම්, පතල් ගී, ගැල් ගී, ප්‍රශස්ති, දරු නැළවිලි ගී, ශාන්තිකර්ම ගී)

(ල. 08)

ii. ඉහත සඳහන් ගීත ලැයිස්තුව අතරින් අසාතාත්මක පැදියක පළමු පේළි දෙක පද ප්‍රස්ථාර කරන්න.

(ල. 04)

04. i. නූර්ති හෝ නාඩගම් රංග ශෛලීන් පිළිබඳව පහත සඳහන් කරුණු ඔස්සේ විස්තර කරන්න.

ආරම්භය හා ව්‍යාප්තිය

සංගීතමය ආභාෂය

යොදාගත් සංගීත භාණ්ඩයන්

නූර්ති නිෂ්පාදකයින් (ල. 08)

ii. ඔබ කැමති නූර්ති ගීතයක ගීත ස්වර ප්‍රස්තාරය ලියා දක්වන්න. (ල. 04)

05. i. පහත දැක්වෙන බටහිර ස්වර ප්‍රස්ථාරය පෙරදිග ක්‍රමයට පෙරළා ලියන්න.



(ල. 04)

ii. පෙරදිග ක්‍රමයට පෙරළා ලියූ ප්‍රස්තාරය මධ්‍යම භාවයට පෙරළා ලියන්න.

(ල. 04)

iii. ඉහත බටහිර ප්‍රස්තාරයේ අංක 1,2 ලෙස යොදා ඇති සංඛේත පිළිබඳ විස්තර කරන්න. (ල. 04)

06. i. සබරගමු නර්තන සම්ප්‍රදාය සඳහා යොදාගැනෙන තාලවාද්‍ය භාණ්ඩය කුමක්ද ? (ල. 02)

ii. එම සම්ප්‍රදායට අයත් වන්නම් දෙකක් හඳුන්වන්න. (ල. 02)

iii. පහතරට වන්නමක කොටස් නම්කරන්න. (ල. 04)

iv. ඔබ උගත් සබරගමු වන්නමක තානම ප්‍රස්තාර කර දක්වන්න.

07. පහත සඳහන් සංගීතඥයින් දෙදෙනෙකු පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

i. බීතෝවන්

ii. මෝසාර්ට්

iii. සී. ද එස්. කුලතිලක